" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.02.03 |
|---|---|---|---|---|---|

පාලන චක්‍රලේඛ අංක **02/2022**

**ආණ්ඩුකාර ලේකම්(බ.ප.),**
**ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),**
**සභා ලේකම් (බ.ප.),**
**ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),**
**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),**
**පළාත් පාලන කොමසාරිස්(බ.ප)/ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (බ.ප.)/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (බ.ප.),**
**පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)/ අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)/ ප්‍රධාන නීති නිලධාරි, නීති ඒකකය (බ.ප.),**
**ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,**

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය ආයතන වල විදුලි බල පරිභෝජනය අවම කිරීම හා බලශක්ති සංරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම</u>**

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක **PUB/LIC/2022/LA/05** හා **2022.01.26** දිනැති ලිපිය මගින්, මේ දින වල ශ්‍රී ලංකාවට බලපා ඇති වියලි කාලගුණ තත්ත්වය හමුවේ සීමා වී ඇති විදුලි බලය සංරක්ෂණය කිරීම උපරිම අයුරින් ක්‍රියාත්මක කිරීම සිදු කල යුතු බව දැනුම් දී ඇත.

**02.** විදුලි බල පරිභෝජනය අවම කිරීම තුලින් බලශක්ති කළමනාකරණයට සහය දීම සියළු දෙනාගේ වගකීමක් මෙන්ම යුතුකමක් ද වේ. ඒ අනුව අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ආයතන වල වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමේදී බලශක්ති සංරක්ෂණ ක්‍රම උපරිම අයුරින් යොදා ගැනීම හරහා බලශක්තිය කාර්යක්ෂමව භාවිත කිරීමට සහය ලබා දීම කෙරෙහි ඔබගේ ප්‍රමුඛ අවධානය යොමු කරවමි.

**03.** ඇතැම් පළාත් පාලන බල ප්‍රදේශවල වීදි පහන් දිවා කාලයේද දැල්වී තිබෙන අයුරු මාධ්‍ය මගින් ප්‍රචාරණය වී ඇති අතර මේ සම්බන්ධව පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ විශේෂ අවධානය යොමු කර කටයුතු කරන ලෙස දන්වමි.

| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளகக் கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606 Fax : 0112092609 dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631 Fax : 0112092647 dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640 Fax : 0112092636 dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532 Fax : 0112092533 dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501 Fax : 0112092505 dcs@eng.wpc.gov.lk | Tel : 0112092628 Fax : 0112092625 cia@cs.wpc.gov.lk |

04. පළාත් පාලන ආයතන මගින් වීදි පහන් දැල්වීම අවම කිරීම හෝ අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීම මගින් ජාතික විදුලි පද්ධතියට බලශක්තිය ඉතිරි කර දීම සඳහා කටයුතු කල යුතුය. එසේම සූර්ය බලශක්තිය සපයා ගැනීම වැනි විකල්ප ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධවද පළාත් පාලන ආයතන ප්‍රධානින් අවධානය යොමු කිරීම වැදගත් වේ.

05. විදුලි පංකා භාවිත කරන ආයතන වල අනවශ්‍ය සෑම අවස්ථාවකදීම ඒවා අක්‍රිය කර තැබීම හා පරිගණක භාවිතයට නොගන්නා අවස්ථා වල නිසි පරිදි අක්‍රිය කර විසන්ධි කර තැබීමට ක්‍රියා කල යුතු අතර ආයතන ප්‍රධානීන් විසින් සුදුසු අධීක්ෂණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. එසේම කාර්යාල වල අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීමට ක්‍රියා කළ යුතු අතර රාත්‍රී කාලයේදී විදුලි පහන් අවම ප්‍රමාණයක් දල්වා තැබීමට කටයුතු කල යුතුය.

06. තවද පවතින වියලි කාලගුණ තත්ත්වය හමුවේ පානීය ජල අර්බුදයටද ලක්වීම වළක්වා ගැනීම සඳහා අරපිරිමැස්මෙන් යුතුව ජලය පරිභෝජනය කිරීමටද කටයුතු කළ යුතුය.

07. ඒ අනුව, ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව හා ආයතනය තුල වැය වන විදුලි ඒකක ප්‍රමාණය අඩු කිරීම සඳහා හැකි සෑම පියවරක්ම ගන්නා ලෙසත්, ඒ සඳහා සුදුසු අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීමට කටයුතු කිරීම මගින් තමා යටතේ පවතින ආයතනවලද බලශක්ති සංරක්ෂණය සිදු කිරීමට උපරිම පියවර ගන්නා ලෙස එකී ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වමි.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත:-

01. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව. - කා.දැ.ගැ.ස.